2019 මැයි 03 යොමු අංකය 1819-054

දයාබර දෙමව්පියන් වෙත,

ඩුබායි දහම් පාසලේ 2018-2019 අධ්‍යයන වසරේ අවසාන පාසල් දිනය මැයි මස 03 වැනිදා වන අද දින වන අතර මැයි මස 10 වැනිදා, සිකුරාදා දින සිට සැප්තැම්බර් 6 වැනිදා, සිකුරාදා දින දක්වා (දින දෙකද ඇතුළුව) දහම් පාසලේ වර්ෂ අවසාන නිවාඩු කාලය ලෙස ප්‍රකාශ කිරීමට දහම් පාසලේ සංවිධායක කමිටුව තීරණය කල බව ඉතා කරුණාවෙන් දැනුම් දෙමු.

දහම් පාසලේ සියලුම පන්ති වල 2018-2019 අධ්‍යයන වසරේ විෂය නිර්දේශ වලට අදාළ සියලුම පාඩම් උගන්වා අවසාන බැවින්ද, දැනට දිනපතා පාසල් වල වර්ෂ අවසාන විභාගය සඳහා පුනරීක්ෂණ පාඩම් කිරීමට අවස්ථාව සැලසීම මූලික වශයෙන් සලකා බැලීමෙන්ද , දෙමාපිය කමිටුවේද අදහස් විමසා බැලීමෙන් අනතුරුව සංවිධායක කමිටුව මෙම තීරණය ගත් බව අවධාරණය කරමු.

මේ අනුව මැයි මස 10 වැනිදා පැවැත්වීමට නියමිතව තිබූ වාර්ෂික ළමා සිල් පිංකම නොපැවැත්වෙන බව කරුණාවෙන් දැනුම් දෙමු.

2019 සැප්තැම්බර් මස 13 වැනිදා, සිකුරාදා දහම් පාසලේ 2019- 2020 නව අධ්‍යයන වසර ආරම්භවන බව ඉතා කරුණාවෙන් දැනුම් දෙමු.

ස්තුතියි,
දහම් පාසලේ සංවිධායක කමිටුව